# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

**නො. 7,462 — 1925ක්වූ මැයි මස 15වෙනි දිනවූ සිකුරාදා.**


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

---

### උපනීති.

කුරුණෑගල සනීපාරක්ෂක සභාව විසින් වර්ෂ 1914ේ අංක 29 දරන ආඥාපනතෙන් අමුතුකරනලද වර්ෂ 1898වේ අංක 13 දරන ආඥාපණතේ 56 (5) සහ 29A යන වගන්ති යටතේ සාදනලදුව කාරක මන්ත්‍රිසභාවේ අනුශාසනය ඇතුව ලංකාණ්ඩුව කරන උතුමාණන්වහන්සේ විසින් අනුදන්නාලද මෙහි පහත සඳහන්වන අතුරුපණත් සහ අයකරන ගාණන් මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

ඒ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තැන වමහ.

වර්ෂ 1925ක්වූ මැයි මස 11වෙනි දින කොළඹ
මහලේකම්තැනගේ කන්තෝරුවේදීය.

### A.—සාමාන්‍ය කරුණු.

(*a*) යම් ලෝකල් බෝඩ් සභාවක සභාපතිතැනගෙන් ලබනලද වාර්ෂික අවසර පත්‍රයක් නොමැතිව කිසිම පාන් ගෙයක්, භෝජන ශාලාවක්, තේ කෝපි කඩයක්, මස් කඩයක්, මාලු විකුණුම්පලක්, ගවගාලක්, කිරිගෙයක් අප්‍රල්ලන ස්ථානයක් හෝ පොදු නවාතැන්පලක්, එබඳු ලෝකල් බෝඩ් සභාවෙන් පාලනය වන නගරසීමාවතුළ කිසිවකු විසින් නොතැබිය යුතුය. ඉහතකී ස්ථානය හැසිරවීම හා එහි පිළිවෙළ පැවැත්වීම පිණිස පණවනලද පහත දක්වන උපනීතිවලින් යමක් හෝ දැනට පවතින යම් යම් ලෝකල් බෝඩ් උපනීති හෝ අනුව ක්‍රියානොකරන යම් අයෙකුට එකී අවසරපත්‍රය නොදීමට සභාපතිතැනට මෙයින් බලය දෙනුලැබේ. එබඳු අවසරපත්‍රය නිකුත්කළේ යම් වර්ෂයක් පිළිබඳවද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31වෙනි දින වනතුරු හෝ එබඳු අවසරපත්‍රය අවලංගුකරනතුරු එහි බලය පැවතේ. තවද එබඳු අවසරපත්‍රය මන්ත්‍රිසභාගත ආණ්ඩුකාරයාණන්වහන්සේගේ අනුමතය ඇතුව ලෝකල් බෝඩ් සභාව විසින් කලින්කල නියමකරන යම් යම් ගෙවිලිවලට යටහත් වේ.

(*b*) ඉහතකී ස්ථානය හැසිරවීම හා එහි පිළිවෙළ පැවැත්වීම පිණිස පණවනලද පහත දක්වන උප නීතිවලින් යමක් හෝ දැනට පවතින යම් යම් ලෝකල් බෝඩ් උපනීති හෝ කඩකිරීම ගැන යම් නඩුසභාවකින් දෙවරක් හෝ ඉන් වැඩි වාර ගණනක් යමෙක් වරදකාරයාවූයේනම් ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැන විසින් මේ පරිච්ඡේදය යටතේ එබඳු අයට දෙනලද අවසරපත්‍රය අවලංගුකිරීමට එසේ දෙවෙනි වරට හෝ ඊට පසුව වරදකාරයාවූ බව සටහන්කරන විනිශ්චය සභාවට නීතිය අනුව බලය තිබේ. අවසරපත්‍රයක් විනිශ්චය සභාවකින් එසේ අවලංගුකළතැනේදී එබඳු අයට අලුත් අවසරපත්‍රයක් නොදීම ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැනගේ කැමැත්තනම් එසේ නොදී හැරීමට ඔහුට බලය තබනලදී. එහෙත් යම් පොදු සභාවක් විසින් පිහිටුවනලද හෝ එබඳු සභාවක් කෙරෙහි පැවරී තිබෙන කඩපළවල වෙළඳ මැසි ගැන මෙම උපනීති නොයෙදෙත්.

### B.—පාන් ගෙවල්.

1. "පාන්ගෙය" යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාරය පිණිස විකිණීමට පාන්, බිස්කෝතු හෝ රසකැවිලි පුළුස්සන්නාවූ යම් ස්ථානයක් හඟවයි. තවද පිළිස්සීම පිණිස එබඳු ආහාර පිළියෙළකරන හෝ එබඳු ආහාර සෑදීමට උවමනා ද්‍රව්‍ය රැස්කර තබන ස්ථානද ඊට අන්තර්ගත වේ.

2. පාන්පිටි අනන කාමරයේ බිම් ප්‍රමාණය අඩුම ගණනේ පළලින් අඩි 12ක්ද දිගින් අඩි 15ක්ද ඇතිවිය යුතුයි. අවහිර නැතුව වාතාශ්‍රය ඇතිවීම පිණිස අඩුගණනේ දෙපැත්තකින්වත් පළල අඩි 7ට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇතිවිය යුතුයි. පෝරනුවේ දොර පිටිඅනන කාමරය කෙළින් නොදැමිය යුතුයි. සෑම පිටිඅනන කාමරයකටම ලෑලි හිඩ නොසිටිනසේ වද්දා සායම් හෝ වාර්නිස් ගානලද වියන්තට්ටුවක් තිබිය යුතුයි. ගේ බිමද බිම සිට අඩි තුනක් උසට බිත්ති සිමෙන්ති ගෑ යුතුයි.

3. සෑම පාන්ගෙයකටම වාතාශ්‍රය සහ ආලෝකය හොඳින් ඇතිවනසේ තැබිය යුතුයි. එහි සෑම කොටසේම බිත්ති උස අඩි 7කින් අඩුනොවනසේ ගඩොල්, ගල් හෝ කණුක්වලින් බැඳ ඇතුළට හුනු පිරියම්කොට හමාසයකට වරක් හුනුහුනු ගෑ යුතුයි. වහල පවතින ද්‍රව්‍යවලින් සෑදිය යුතුයි. වියන් තට්ටුව විඩතු නොසිටිනසේ ලෑලි වද්දා සායම් හෝ වාර්නිස් ගා තිබි

යුතුය. ගේ බිම සෑම තැනද අඩි 3ක් උසට බිත්තිද සිමෙන්ති දමා තිබිය යුතුයි. සෑහෙන පමණ කාණුවලින් යුක්තවිය යුතුයි. ඇරීමට හැකිවූද ගෙබිම වගී ප්‍රමාණයෙන් දහයෙන් පංගුවකට අඩුනොවෙන වගී ප්‍රමාණයක් ඇත්තාවූද කවුළු සෑම කාමරයටම තැබිය යුතුයි.

4. පාන් සහ කැවිලි සෑදීමේදී පාවිච්චිකරන සියලුම භාජන හා බක්කි ඉතාම පිරිසිදුව තබාගත යුතුයි. තවද ඒවා ගෙබිම ශුද්ධකිරීම පිණිස ඉවත්කිරීමටද හැකිවිය යුතුයි.

5. අවුරුද්දකට වරක්වත් ගෙබිම පරිස්සමින් හුරු පිසදැමිය යුතුයි තවද එම කුණුකසළ දිය කාන්දු නොවන වසාතලද භාජනයකට එවේලේම දමා දිනපතා පාන් ගෙයින් ඉවත්කළ යුතුයි.

6. සෑම පාන්ගෙයකම පිරිසිදුවද කාණු, වැසිකිළි හෝ කුණුවළවලින් හෝ අනිකුදු අප්‍රිය දෙයින් නැගෙන ගඳින් ඈත් කොරව තබාගත යුතුයි.

7. කිසිම පාන්ගෙයක් කුණුවළකින්, පෝරගොඩකින් ඇරතිබෙන කාණුවකින් හෝ වැසිකිළියකින් අඩි 50ක් ඇතුළත නොතැබියයුතුයි.

8. පාන් සහ රසකැවිලි සෑදීම පිණිස වුවමනා බඩුබාහිරාදිය හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙයතුළ නොතැබියයුතුයි.

9. මෙසතට්ටු හොඳකාර මෝරපු හොඳින් වද්දනලද ලෑලිවලින් හෝ අන්තරාය රහිත දියකාන්දු නොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ සෑදියයුතුයි. තවද ඒවා දිනපතා හුරු ශුද්ධකළයුතුයි.

10. කොයිනම් කරුණක් නිසාවත් කිසිම සතකු පාන්ගෙයි තබා නොගතයුතුයි.

11. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ පාන්ගෙය භාර යමකු දැනුවත්ව මෑතදී පෙළුණාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදිසිටියාවූ කෙනකුට පාන්ගෙයට ඇතුල්වෙන්නට හෝ එහි පාන් බිස්කෝතු හෝ රසකැවිලි සෑදීමට හෝ විකිණීමට සම්බන්ධ වෙන්නට පාන්ගෙය භාර එබඳු අය විසින් ඉඩ නොදිය යුතුයි.

12. පාන් සෑදීමේ හා පිලිස්සීමේ යෙදීසිටින සියලුදෙනාම පාන් සෑදීමේ කටයුත්තෙහි යෙදෙන්නට මත්තෙන් අත් සෝදාගෙන පපුව සහ ශරීරය වැසෙනසේ පිරිසිදුවූ සුදු මැස්මක් සහ සුදු තොප්පියක් හෝ තලප්පාවක් ඇන්දයුතුයි.

13. පාන්, බිස්කෝතු සහ රසකැවිලි සෑදීමෙහි යෙදීසිටින්නන්ගේ පාවිච්චියට පිරිසිදු වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

14. විකිණීමට තබනුලබන සියලුම පාන් බිස්කෝතු සහ රසකැවිලිආදී මැස්සන්ට ඇතුල්වෙන්ට ඉඩනොදී නිසිලෙස සාදනලද වීදුරුපෙට්ටිවල තැබියයුතුයි. පෙට්ටි ඉතාම පිරිසිදුව තැබියයුතුයි.

15. පාන් සෑදීමටගන්නා පිපි වතුර සහ අනිකුත් ද්‍රව්‍ය යහපත් ආහාර පිණිස යෝග්‍යඒවා වියයුතුයි. තවද බිමෙන් අඩි 3ක් උස්කොට සාදනලද උස් ස්ථානයක පිපි තැබියයුතුයි.

16. පාන්ගෙය පිහිටි ස්ථානය අවට තිබෙන කසල සියල්ලම දිනපතා ඉවත්කළයුතුයි. කාණුද හොඳකාර වතුර ගසා සේදියයුතුයි.

17. පාන්ගෙයි මට්ටමට පිහිටි එම ගොඩනැගිල්ලේ කිසිම කොටසක් එය බිම පවත් වියන්තට්ටුව දක්වා හොඳකාර පාන්ගෙයින් වෙන්කර තිබේනම් මිස නැත්නම් නිදාගැනීමට නොගතයුතුයි මූත්‍ර කොටුවක් හෝ වැසිකිළියක් හෝ අප වළක් පාන්ගෙය ඇතුළේ හෝ ඊට සම්බන්ධකර හෝ නොතැබියයුතුයි.

18. සෑම සුදුසු වේලාවලටද පාන් පිලිස්සීම කරන්නාවූ ඕනෑම විටකද යම් පාන්ගෙයකට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානයකට ඇතුල්ව පරීක්ෂාකිරීමට ලෝකල් බෝඩ් සභාවේ පරීක්ෂකතැනට හෝ සභාපතිතැන විසින් ලියවිල්ල කින් බලයදෙනලද වෙන කෙනකුට හෝ නීතියේ ආකාර බලය තිබේ.

19. මේ උපනීතිවල පිටපතක් රාමුවක දමා සෑම පාන්ගෙවලම හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබියයුතුයි.

## C.—භෝජන ශාලා හා තේ කෝපි කඩ.

1. සියලුම භෝජනශාලා සහ තේ කෝපි කඩ සභාපතිතැන සෑහෙයි පිළිගන්නා ප්‍රමාණයට පිරිසිදුව සනීපය ආරක්ෂා වනසේ තැබියයුතුයි.

2. යම්කිසි භෝජන ශාලාවකට හෝ තේ කෝපි කඩයකට අයිතිවූ හෝ එහි පාවිච්චියට ගනුලබන භාජන, බඩුබාහිරාදිය සහ අනිකුත් උවමනා ද්‍රව්‍ය නිරන්තරයෙන්ම පිරිසිදුව තැබියයුතුයි. තේ කෝපි කඩවල පාවිච්චියට ගන්නා මේස සින්ක් තහඩුවලින් වසා තිබියයුතුයි.

3. සියලුම භෝජන ශාලාවල සහ තේ කෝපි කඩවල සියලුම බිත්ති හුනුපිරියම්කොට සුදුහුනු ගෑ යුතුයි. කාමර හොඳින් වාතය හා ආලෝකය ලැබෙනසේ තිබියයුතුයි. ගෙබිම සිමෙන්ති පිරියම් කළයුතුයි.

4. යම්කිසි භෝජන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පිහිටි ස්ථානයේ හෝ ඒ අවට තිබෙන සියලුම කුණු සහ කසල දවසකට දෙවරක් බැගින් ඉවත දැමියයුතුයි.

5. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භෝජන ශාලාවක් හෝ තේ කෝපි කඩයක් භාරව සිටින තැනැත්තකු දැනුවත්ව මෑතදී පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයකුට මෑතදී සාත්තුකිරීමෙහි යෙදී සිටියාවූ කෙනකු එබඳු භෝජන ශාලාවේ හෝ තේ කෝපි කඩේ භාරව සිටින අයකු විසින් එබඳු යම් භෝජන ශාලාවක හෝ තේ කෝපි කඩයක හෝ ඒ අවට වැඩෙහි යෙදෙන්නට ඉඩ නොදියයුතුයි.

6. එබඳු ස්ථානයන්හි ප්‍රයොජනයට ගන්නා සීනි, වීදුරුමූඩි ගසනලද කට පළල් බෝතලවල දමා තැබියයුතුයි.

7. විකිණීමට තබනලද සියලුම රසකැවිලි ආදිය නිසිලෙස සාදනලද වීදුරු පෙට්ටිවල මැස්සන්ගෙන් තොරව තැබිය යුතුයි. කිසිම ආහාර ද්‍රව්‍යයක් මැස්සන්ගෙන් දූෂිතවනසේ නොතැබියයුතුයි. ප්‍රයොජනයට ගන්නා වීදුරු පෙට්ටි හොඳින්ම පිරිසිදුව තැබියයුතුයි.

8. අහක යන තේ, කෝපි රොඩු හෝ අහකදමන කිරි හෝ කෑම ඉඳුල් හෝ පිසීමේදී අහකයන ද්‍රව්‍ය බිම විසි නොකොට ඊට නිසි භාජනයක එකතුකොට දිනපතාම ඉවත්කළයුතුයි.

9. කිසිම භෝජන ශාලාවක් හෝ තේ කෝපි කඩයක් පිහිටි ස්ථානයක කලවම් කිරි විකිණීම හෝ මුදලට ගන්නට තිබීම හෝ විකිණීමට තැබීම හෝ එහි තබාගැනීම නොකළයුතුයි.

මේ උපනීතිය සම්බන්ධව කලවම් කිරි යන්නෙන් හඟවන්නේ ඒ ස්ථානයට පැමිණෙන්නන් විසින් එවලේම බීම පිණිස තේ කෝපි හෝ වෙන බොනදෙයක් සෑදීම පිණිස නොව එහි ප්‍රමාණය වැඩිකිරීම හෝ තත්වය තිබෙනවාට වඩා හොඳසේ පෙන්වීම පිණිස වතුර හෝ වෙනයම් පිටස්තර ජලයක් හෝ මිශ්‍රකරනලද කිරීයි.

10. මේ උපනීති රාමුවක දමා සෑම භෝජන ශාලාවේ හෝ තේ කෝපි කඩේ හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබියයුතුයි.

## D.—ගාල්.

1. අවසරලත් සෑම ගාලම සභාපතිතැන විසින් ලියාපදිංචිකළයුතුයි. "නොම්මර........ලියාපදිංචිකරනලද ගාල" යන වචන සහ අයිතිකාරයාගේ නාම පින්තාරු කරනලද දැන්වීම් ලෑල්ලක් අවසරලත් තැනැත්තා විසින් එවැනි සෑම ගාලුව ඇතුල්වන දොරටුවේ එල්ලා තැබියයුතුයි.

2. සෑම ගාල නොහොත් කරත්ත හෝ ගවයින් නවත්වන ස්ථානය සභාපතිතැනට සෑහෙන ලෙස පිළිගන්නා අන්දමට සමකොට කාණුදමා තිබියයුතුයි. බිම තදව සමව තිබෙනසේ ගලින් බැඳ හෝ ගල්කැලි දමා හොඳකාර තදකොට තැබියයුතුයි. එවැනි ගාලක හෝ ගවයින් හෝ වෙන සතුන් නවත්වනතැනක තිබෙන සියලුම ගොඩනැගිලි 3වෙනි උපනීති යට එකගවනසේ සාදා පවත්වා ගතයුතුයි. එවැනි ගාල් හෝ නවත්වනතැන් දිනපතා හොඳකාර පවිත්‍රකිරීමෙන්ද ගොම සහ කුණු කසල මිනිසුන් වාසයකරන ගෙවලින් ඈත සභාපතිතැන හොඳයයි ඒත්තුගන්නා තැනකට ඉවත්කිරීමෙන්ද පිරිසිදුව සහ සනීපය ආරක්ෂාවන අන්දමට තබාගතයුතුයි. ගාල එසේ දිනපතා පවිත්‍රකිරීම අවහිරවනසේ කිසිම බඩුවක් ලීදඬු ආදියක් හෝ වෙනයම් ද්‍රව්‍යයක් එවැනි ගාලක හෝ නවත්වනතැනක නොතැබිය යුතුයි.

3. අස්හලක් හෝ ගවමඩුවක් හෝ ගවයන් නවත්වන ස්ථානයක් වශයෙන් යොදන සෑම ගොඩනැගිල්ලක හෝ මඩුවක අයිතිකාරයා, බදුකාරයා හෝ පදිංචිකාරයා සභාපතිතැන සතුටුවනාකාර සෝදහරිනදේ මූත්‍ර හෝ වැසිවතුර ගලායාමට කිසියාකාර සිමෙන්ති දැමූ කාණු සෑදිය යුතුයි. එසේද වූවත් සභාපතිතැනට වුවමනායයි කල්පනාවේනම් එම කාණුවලින් යන මූත්‍ර හෝ සෝදාදමන දේවල් සභාපතිතැන විසින් අණකළ පරිදි සාදන ලද්දාවූ වැසූ භාජනයකට හෝ භාජනවලට වැක්කෙරෙනසේ එම කාණු සෑදීමට සභාපතිතැනට අණකරන්ට පුළුවන. ඒවායේ තිබෙන කුණු එම අයිතිකාරයාගේ හෝ බදුකාරයාගේ හෝ පදිංචිකාරයාගේ වියදමින් දිනපතාම ඉවත්කර එයින් කිසිම හිරිහැරයක් නොවන ක්‍රමයකට නැති කර දැමීමට සැලැස්විය යුතුයි. එවැනි ගොඩනැගිල්ලක බිම ගඩොලින් බැඳ සිමෙන්තිගා හෝ ගලින් හෝ සිමෙන්ති හා කලුගලින් ගල්තාරවලින් හෝ පහසුවෙන් පිරිසිදුව තබාගතහැකි වෙනයම් තද ද්‍රව්‍යයකින් බැඳ සමකොට හොඳකාර අලුත්වැඩියාකරමින් තබාගත යුතුයි. එවැනි ගොඩනැගිල්ල හුණුගෑමට සාදා තිබේනම් එය හමාසයකට වරක් හෝ සභාපතිතැන අණකරන්නේනම් ඊට වැඩි වාර ගණනක් සුදුහුණු ගෑයුතුයි. එසේ වුවත් එවැනි ගොඩනැගිල්ලේ හෝ මඩුවේ පටන් වාසය කරන ගෙයකට ඇති දුර ප්‍රමාණය නිසා හෝ වෙනයම් කාරණාවක් නිසා සභාපතිතැන එය උවමනා නැතැයි සිතානම් ඉහත සඳහන් අණපණත්වලින් ඕනෑම එකක් ගැන සභාපතිතැනට බුරුල දියහැකිය.

ඒ ඇරත් වුවමනායයි සභාපතිතැනට කල්පනාවේනම් අස්හලක්, ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට යොදන යම්කිසි ගොඩනැගිල්ලක් ගලින්, ගඩොලින් හෝ වෙන පවතින ද්‍රව්‍යයකින් සෑදීමටද උළු යකඩ පෙට්ටියක් දැමීමටද අණකිරීමට සභාපතිතැනට පුළුවන.

4. සෑම අස්හල් ගවමඩු හෝ ගවයින් නවත්වන තැන් දිනපතා හොඳින් පවිත්‍රකොට පිරිසිදුව සනීපය ආරක්ෂාවන ලෙස තැබිය යුතුයි. තවද ගොම සහ කුණු කසල මිනිසුන් වසන ගෙවලින් ඈත සභාපතිතැන විසින් යෝග්‍යයයි පිළිගන්නා ස්ථානයකට දිනපතාම ඉවත්කර දැමියයුතුයි.

5. සෑම ගාලම සභාවේ මුලාදැනි විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනලද වෙන කෙනකු විසින් ඕනෑවිටක පරීක්ෂාකිරීමට ඇර තිබිය යුතුයි.

6. මේ උපනීති යටතේ කිරීම පිණිස සභාපතිතැනට බලයදී තිබෙන සියලුම නියොග ලියවිලිවලින් කළයුතුයි.

## E.—අපුල්ලන ගෙවල්

1. මෙම උපනීති උදෙසා "අපුල්ලන ගේ" යන්නෙන් කුලියට අනුන්ගේ ඇඳුම් ඇපිල්ලීමේ රක්ෂාව කරන යමෙකු වාසයකරන ස්ථානය හඟවයි. "අපුල්ලන්නා" යන්නෙන් එවැනි වැඩක යෙදී සිටින කෙනෙකු හෝ එවැන්නෙකු යටතේ වැඩකරන්නකු හෝ ඔහුගේ ආධාරකාරයකු හඟවයි.

2. සභාපතිතැන විසින් ඕනෑකළවිට සෑම අපුල්ලන්නාම කිළුටු රෙදි තබාගැනීම පිණිස වෙනම කාමරයක් සූදානම් කර තැබිය යුතුයි. තවද එකී කාමරය නිතරම හොඳකාර වාතාශ්‍රය ඇතිවනසේද පිරිසිදුවද අවුරුද්දකට දෙවතාවක් බැගින් සුදුහුණු ගාදා තබාගතයුතුයි.

3. පදිංචි කාමරයක්සේ ප්‍රයෝජනයට ගන්නා කිසිම කාමරයක අපුල්ලන්නා විසින් කිළුටුරෙදි නොතැබිය යුතුයි.

4. මහජනයාගේ සනීපය පවත්වා ගැනීමේ යහපත හා ප්‍රයෝජනය සඳහා උවමනායයි සභාපතිතැන කල්පනාකරන විට රෙදි ඇපිල්ලීම පිණිස විශෙෂ ස්ථාන වෙන්කර තබනවා ඇත. එවැනි ස්ථාන දැන්වීම් ලෑල්ලකින් පෙන්නුම්කරනු ලැබේ.

5. යම් අපුල්ලන්නකුට හෝ ඔහුගේ පවුලේ හෝ ගෙදර කෙනෙකුට යම්කිසි පැතිරෙන නොහොත් බෝවෙන රෝගයක් වැළඳුණිනම් ඔහු පැය 24ක් ඇතුළතදී ඒ බව ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට සභාවේ ලේකම්තැන මගින් හෝ පරීක්ෂකතැන මගින් දැනුම්දිය යුතුයි.

6. යම් අපුල්ලන්නකුට ඔහුගේ පවුලේ හෝ ගෙදර කෙනෙකුට හෝ යම්කිසි පැතිරෙන නොහොත් බෝවෙන රෝගයක් වැළඳුණකල අපුල්ලනගෙයි වැඩ වහාම නැවැත්වියයුතුයි. එබඳු රෝගයක් පටන්ගත් පසු එය පවත්නාතුරු සභාපතිතැනගේ විශෙෂ අවසරයකිම කිසි අපුල්ලනගෙට ඇඳුම් ගෙනඒම හෝ එයින් පිටත ගෙනයෑම නොකළ යුතුයි.

7. යම් ගෙයක වාසයකරන්නකු බෝවෙන රෝගයකින් පෙළෙනබව විශ්වාසකිරීමට කාරණ තිබේනම් ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැනගේ, සනීපාරක්ෂක කොමිසාරිස්තැනගේ, ඔහුගේ සහකාරතැනගේ හෝ පළාත් භාර වෛද්‍ය මූලාදැනිතැනගේ හෝ අවසරය නැතිව එවැනි ගෙයකින් කිසිම අපුල්ලන්නකු විසින් කිළුටුරෙදි නොගතයුතුයි.

8. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් සනීපාරක්ෂක කොමිසාරිස්තැන විසින් ඔහුගේ සහකාරතැන විසින් හෝ පළාත්භාර වෛද්‍යමූලාදැනිතැන විසින් ඉල්ලාසිටිකල සෑම අපුල්ලන්නාම ඔහු ලවා රෙදි අපුල්ලවාගන්නා අයවලුන්ගේ නාම ලේඛනයක් දියයුතුයි.

## F.—පොදු නවාතැන් ගෙවල්.

1. මෙම උපනීතිය උදෙසා "පොදු නවාතැන් ගෙවල්" යන්නෙන් එකපවුලේ අය නොවන සතරදෙනකු හෝ වැඩි ගණනක් කුලියට නවත්වාගන්නා ගෙයක් හෝ ගෙයකින් කොටසක් හඟවයි.

2. පොදු නවාතැන් ගෙයක් ශක්තිමත්ලෙස සාදා හොඳකාර අලුත්වැඩියාකරමින් තබාගත යුතුයි. තවද නිදාගන්න කාමර සභාපතිතැනට මැනවැයි පිළිගන්නා අන්දමට හොඳකාර වාතාශ්‍රය හා එළිය ඇතුව්ද තබාගත යුතුයි. තවද එ බිත්ති අවුරුද්දකට තුන් වරක් බැගින් සුදුහුණු ගෑ යුතුයි.

3. පොදු නවාතැන් ගෙයක් භාරකාරයා නිතරම ඒ ස්ථානය පවිත්‍රවද, සනීපය ආරක්ෂාවනසේද තබාගත යුතුයි. ඕ කුණු කසල සහ දුගඳ ද්‍රව්‍ය සියල්ලම එම ස්ථානයෙන් ඉවත්කරවිය යුතුයි.

4. පොදු නවාතැන්පළක සිටින යමකුට පැතිරෙන නොහොත් බෝවෙන රෝගයක් වැළඳුණ කල්හි නවාතැන්ද භාරකාරයා විසින් හෝ එවැනි අය විසින් ලෝකල්බෝඩ් සභාවේ ලේකම්තැන හෝ පරීක්ෂකතැන මගින් ඒ බව ඒ ගැනිසි බලයලත් මූලාදැනිතැනට වහාම දැන්විය යුතුයි.

තවද නවාතැන්පළින් අස්වීම සඳහා හෝ ඇඳ ඇතිරිලි ආදියෙන්ද, ඇඳුම්වලින්ද, අනිකුත් දේවලින්ද රෝග බෝවීම වැළැක්වීම හා ඒවා විනාශකිරීම සඳහාද ගෙයට දුම් ඇල්ලීම එහි රෝග බෝවීමට හේතු දේ නැතිකිරීම සහ සුද්ධහුණු ගෑම සඳහාද නීති බලයලත් මූලාදෘනියා විසින් කරන නියෝගවලට ඔහු කීකරුවිය යුතුයි.

5. පොදු නවාතැන් ගෙයක සිටින අයට සෑහෙන පමණ වැසිකිළි තබාගැනීම සහ ඒවා සනීපාරක්ෂාවට සුද්ධවලෙස තැබීම ගැනත් ඒ නවාතැන්පළ භාරකාරයා වග කියයුතුයි.

6. යම්කිසි පොදු නවාතැන්පළක නැවතීමට ඉඩ දියහැකි අයවලුන් ගණන නියමයකිරීමේ බලය ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට මෙයින් පැවරේ. තවද එබඳු ගණන අවසර පත්‍රයේ සඳහන්කළ යුතුයි. ඒ ගණනට වැඩියෙන් ඉන්නට ඉඩහරින යම්කිසි පොදු නවාතැන්පළක් භාරකාරයෙක් ඇද්ද හෙතෙම වරදක්කිරීම ගැන වැරදිකාරයෙක් වේ. මේ උපනීතියේ අදහස සඳහා වයස අවුරුදු දොළහෙන් පහළ ළමයින් දෙදෙනෙක් එක් අයකුමෙන් ගැණෙත්.

7. ලෝකල්බෝඩ් සමිතියේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂා කොමිසාරිස්තැන විසින් හෝ ඔහුගේ සහකාරතැන විසින් හෝ පළාත භාර වෛද්‍ය මූලාදෘනිතැන විසින් හෝ නාගරික සභාවේ ලේකම්තැන විසින් හෝ එහි පරීක්ෂක කෙනකු විසින් පොදු නවාතැන් ගෙයක් තිබෙන ස්ථානය පරීක්ෂාකිරීමට නිතරම අවකාශ තිබිය යුතුය.

## G.—සාමාන්‍ය පවිත්‍රකිරීම.

1. තමන්ගේ ගේ දොර අවට තිබෙන දූවිලි, අළු, කැලිකසල හා අනිකුදු රොඩු සභාවට අයිති ශුද්ධකරන්නන් ලවා ඉවත්කරවාගැනීමට කැමති ගෙවල්වල පදිංචිකාරයන් හෝ අනිකුදු සියලු අය විසින් ඒවා පියන් සහිත නිසි පෙට්ටිවල හෝ වෙනත් භාජනවල දමා තමන්ගේ ඒ ඒ ගෙවල් හෝ කඩවලින් පිටත පාර අද්දර උදේ 6ටත්, 8ටත් අතර තැබිය යුතුයි. තවද කිසිවකු විසින් එබඳු දූවිලි, අළු, කැලි කසල හා අනිකුදු රොඩු යටකී ලෙස පෙට්ටිවල හෝ වෙන භාජනවල නොදමා හෝ නියමකළ වේලාවෙන් පසුව හෝ කොයිම වීථියකවත් තැබීම හෝ තැබීමට සැලැස්වීම නීති විරෝධවේ. තවද එවැනි සෑම අයම ශුද්ධකරන්නන් විසින් පෙට්ටිවල හෝ වෙනත් භාජනවල තිබෙන දේ රැගෙන ගොස් පැය බාගයක් තුළදී එම පෙට්ටි හෝ භාජන ඉවත්කර ගතයුතුයි.

## H.—අනතුරය සහිත සහ අප්‍රියකර වෙළඳාම්.

1. මේ උපනීති උදෙසා අනතුරය සහිත අප්‍රියකර වෙළඳාම් යන්නෙන් මෙහි පහත දක්වන යම් එකක් හෝවයි හෝවත් එහි මෙහි පහත දක්වන යම් එකක් අන්තර්ගතවෙයි. එනම්, සාදන පෝර ගබඩාකර තැබීම හෝ සෑදීම, ලේ හෝ මස් රොඩු තැම්බීම, ලේ හෝ මස්රොඩු වේළීම, සම් පදම්කිරීම, සතුන්ගේ තෙල උණුකිරීම, සතුන්ගේ තෙල් පෙරීම, සබන් සෑදීම, පොල්ලෙලි පල්කිරීම, කොහු සායම්කිරීම, පොල්තෙල් මිරිකීම (යන්ත්‍ර සූත්‍ර යොදන තැන්වල) කොහු කර්මාන්තය සහ රැස්කර තිබීම, සම්, ඇටකටු සහ ඇට ගබඩාකර තැබීම, සාදන පෝර හෝ පෝරසෑදීම පිණිස ගන්නා යම් ද්‍රව්‍යයක් ගබඩාකර තැබීම, ගොණ්බර 5කට වැඩියෙන් උම්බලකඩ ගබඩාකිරීම, උළු, ගඩොල් කැපීම, හුනු පිලිස්සීම, සිසිල්බීම සෑදීම, මිනිරන් ඇතිරීම හෝ ශුද්ධකිරීම.

2. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනගෙන් අවසර පත්‍රයක් නැතුව ලෝකල්බෝඩ් සභාවේ සීමාතුළ පිහිටි යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එම ඉඩමේ හෝ ස්ථානයේ කිසිම අනතුරය සහිත හෝ අප්‍රියකර වෙළඳාමක් හෝ හස්තකර්මාන්තයක් කිරීම හෝ කරන්නට ඉඩහැර සිටීම නොකළ යුතුයි. මෙම උපනීතිවලින් හෝ ලෝකල්බෝඩ් සභාවේ දැනට පවත්නා අනිකුදු උපනීතිවලින් යමකින් වුවමනාදේ නොකරහරින යම් කිසිවකුට එම අවසර පත්‍රය නොදීමට සභාපතිතැනට වැඩිදුරටත් බලය දෙනලදී.

එවැනි අවසර පත්‍රය කාරකමන්ත්‍රී සභාගත ආණ්ඩුකාරයාණන්ගේ අනුමතිය ඇතිව කලින්කල ලෝකල්බෝඩ් සභාව විසින් නියමකරනු ලබන බැරපන් ගෙවීමට යටහත්වේ.

3. මෙම උපනීතිවලින් යමක් කඩකිරීම ගැන යමෙක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් යම් උසාවියකින් වරදකාරයාවිනම් එසේ දෙවෙනිවර හෝ ඊටපසු වරක වරදකාරයා බව සටහන්කරන උසාවියට මෙම උපනීති යටතේ ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් එම අයට දෙනලද අවසර පත්‍රය ව්‍යවස්ථානුකූලව අවලංගුකළ හැක. උසාවියෙන් අවසරපත්‍රයක් එසේ අවලංගුකරනුලැබූ කල්හි එම අයට අලුත් අවසර පත්‍රයක් සභාපතිතැන කැමතියේ නොදීහරින්නට ඔහුට බලය තිබේ.

4. යට කියනලද වෙළඳාම්වලින්, ව්‍යාපරවලින් හෝ කර්මාන්තවලින් යම්කිසි එකක් කරගෙනයාම පිණිස උවමනා කරන්නාවූ සියලුම ද්‍රව්‍ය දූෂ්‍යවාතය හෝ අප්‍රසන්නතාවය වැළකෙන පරිදි අහුරා තැබිය යුතුයි. ප්‍රසිද්ධ පාරක් දිගේ ගෙන යාමට තිබෙන අප්‍රියකර, ගඳගහන සියලුම ද්‍රව්‍ය එබඳු අප්‍රසන්නයක් ඇතිවීම වළක්වන පිණිස දිය බිංදු නොගන්නාවූ වසනලද භාජනවල දමා හෝ සභාපතිතැන විසින් නියමකරන වෙන ප්‍රකාරයකින් හෝ ගෙනයා යුතුයි.

5. යම්කිසි ද්‍රව්‍යයක් සෑදීමේදී පිටවෙන දූෂ්‍ය වාතය සහ විෂදුම උපද්‍රව රහිත කරවීම පිණිස සෑහෙන උපක්‍රම යෙදිය යුතුය. එවැනි හුමාල හෝ දුම් ඉන් අන්තරායක් හෝ ගඳක් නැතුව පැතිරයාම හැකිවනසේ ඊට සෑහෙන පමණ උසින් පිටකළ යුතුයි. නැතහොත් ඒවා කෙළින්ම ගින්නක් මැදින් හෝ වාෂ්ප ඝණකරන යන්ත්‍රයකට හෝ හැරිය යුතුයි. මුළු ස්ථානයේම කෙත් ද්‍රව්‍ය බැහැයාම පිණිස සෑහෙන පමණ කාණු බැද ඒවා මනාසේ පවත්වාගෙන දිනපතා සේදිය යුතුයි.

6. ගෙබිම කැඩුම් බිඳුම් නැතුව හොඳින් තබාගෙන දිනපතා පවිත්‍රකල යුතුයි. තවද සභාපතිතැන විසින් නියමකළ කල්හි ඒවා දිය පිටවිය නොහැකි ද්‍රව්‍යයකින් තැනිය යුතුයි

7. බිත්ති කුණු උරාගැනීම වළකිනසේ යහපත් ලෙස තබා අවුරුද්දකට දෙවරක් හෝ නාගරික සමිතියේ සභාපතිතැන, සනීපාරක්ෂක කොමසාරිස්තැන, ඔහුගේ සහකාරතැන හෝ, පළාත භාර වෛද්‍යමූලාදෘනිතැන විසින් එසේ නියම කළොත් ඊට වැඩිවාර ගණනක් සුදු හුනු ගෑයුතුයි.

8. මෙවලම් සහ භාජන ඇතුළුව සියලුම උපකරණ පවිත්‍රව තැබිය යුතුයි. තවද හැකිවිට ඒවා දිනපතා සේදිය යුතුයි. අහකදමන පිසදමන සූරාහරින සෑමදේද සායම් රොඩුද එම ස්ථානයේදීම නවත් වෙළඳාම් පිණිස කටයුත්තකට වහාම යොදන්නට අදහසක් නැත්නම් වසනලද භාජනවල දමා දිනපතා ඒ ස්ථානයෙන් ඉවත්කළ යුතුයි.

9. සම් හෝ වෙනයම් ද්‍රව්‍යයක් සේදීමට හෝ පෙගවීමට පාවිච්චිකර වතුර බක්කිවලින් නඟින ගඳ වැළැක්වීමට උවමනා පරිදි නිතර නිතර එහි වතුර අහක්කොට පවිත්‍රකළ යුතුයි.

10. යම්කිසි අප්‍රියකර වෙළඳාමක් හෝ කර්මාන්තයක් කරන්නාවූ කෙනෙකු විසින් හෝ එවැනි වෙළඳාමක් හෝ කර්මාන්තයක් කෙරෙන ඉඩමක හෝ ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් යම් කුණුවූ ගඳගහන අප්‍රිය උපදවන වතුර හෝ වෙනයම් දිය ද්‍රව්‍යයක් දැමීමෙන් හෝ දමන්ට ඉඩඇරීමෙන්ද යම්කිසි අප්‍රිය උපදවන ද්‍රව්‍යයක් විසිකිරීමෙන් හෝ සෝදන්ට ඉඩඇරීමෙන්ද යම් ගඟක්, දොළක්, ඇලක්, දියපාරක්, ළිඳක්, වැවක් හෝ වැසුම් රහිත ජලාශයක් අපවිත්‍ර නොකළ යුතුවත් ඇර වෙන කිසිම මාර්ගයකින් එවැනි ගඟක්, දොළක්, ඇළක්, දියපාරක්, ළිඳක්, වැවක් හෝ නොවැසි ජලාශයක් අපිරිසිදු හෝ දූෂ්‍යනොකළ යුතුයි.

11. යටකියනලද සියලුම කටයුතුකෙරෙන ස්ථාන ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සභාපතිතැනගෙන් නිසිලෙස බලයලත් යමකු විසින් සෑහෙන සියලුම වේලාවලදී පරීක්ෂාකිරීමට අවකාශ ඇතිසේ තිබිය යුතුයි.

12. උළු ගඩොල් කැපීම හෝ ගොඩනැගිලිකිරීම පිණිස හෝ වෙනයම් කටයුත්තක් සඳහා මැටි, පස්, ගල්, බොරලු, කබුක්ගල් හෝ වෙනයම් ද්‍රව්‍යයක් කපාගත්තාවූ ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එහි කිසිලෙස වතුර බැසයාමට කාණු කැපීම ගැනද වතුර නැවති පල්විය නොහැකිවන පරිදි එම වළවල් සහ අගල් පසුව පුරවා දැමීම ගැනද වගකිය යුතුවේ.

## I.—සිසිල් බීම වර්ග සෑදීම.

1. මාසයකට කලින් ලියවිල්ලකින් සභාපතිතැනට දැනුම්නොදී ලෝකල් බෝඩ් සභාවට අයත් මායිම්තුළ කිසිවකු විසින් වෙළඳාම පිණිස එයරේටඩ් වෝටර්ස් නැමැති සිසිල් බීම සෑදීමට පටන්නොගත යුතුයි.

2. ප්‍රසිද්ධ ගාලකින්, අශ්වගාලකින් දිවා රෑ දෙක්හි සතුන් තබාගැනීම පිණිස යොදන ස්ථානයකින් අසූචි වළකින් හෝ වැසිකිළියකින් අඩි 150ක් ඇතුළත සිසිල් බීම සාදන ස්ථානයක් නොපිහිටිය යුතුය. එම කර්මාන්තශාලාවේ කිසියම් කොටසක පදිංචිවීමද තහනම්ය.

3. සිසිල් බීම සෑදීම් පිණිස පාවිච්චිකරන සෑම ස්ථානම හොඳකාර එළිය හා වාතය ඇතුල්වන අන්දමට තිබෙන්ට ඕනෑය. බිමට සිමෙන්ති දමා නිශ්චල ද්‍රව්‍ය පිටකිරීම පිණිස හොඳකාර කනනලද කාණු සාදා තිබෙන්ට ඕනෑය. ස්ථානය කුණු කසල සහ දූවිලි නැතුව පිරිසිදුව තිබෙන්ට ඕනෑය. පැනිවර්ග සෑදීම් මැස්සන්ට ඇතුල්විය නොහැකිසේ සාදනලද වෙනම කාමරයක කළයුතුයි. එම බීම සෑදීමට ගන්නා සියලුම බෙහෙත් වර්ග සහ අන්‍ය ද්‍රව්‍ය හොඳ නැවුමේ වියයුතුයි. මෙම කර්මාන්තයෙහි යොදෙන සියලුම භාජන සහ යන්ත්‍රාදියද, ඉතා සැලකිල්ලෙන් පිරිසිදුව තබාගත යුතුයි.

4. බීම සෑදීම පිණිස ගන්නා වතුර අපිරිසිදුවිය නොහැකි අන්දමට හොඳට ආරක්ෂාකරනලද සභාවේ සභාපතිතැන විසින් යෝග්‍යයයි පිළිගනුලැබූ ස්ථානයකින් ගතයුතුයි. එම වතුර කර්මාන්තශාලාවට ගෙනඒමේදී දූෂ්‍යනොවන අන්දමකට ගෙනයිය යුතුයි. ඒ වතුර කර්මාන්තශාලාවේ යන්ත්‍ර හා සම්බන්ධවූ හොඳින් සෑදූ බක්කි නොහොත් ජලාශවල රැස්කොට තැබිය යුතුයි.

5. මේ සඳහා ගන්නා වතුර යන්ත්‍රයට සම්බන්ධවූද සභාවේ සභාපතිතැන විසින් මැනවැයි පිළිගන්නාලද්දාවූද ජුවල් හෝ අන්කිසි වර්ගයක වතුර පෙරෙන භාජනයකින් පෙරීයන්ට ඕනෑවේ. පොදුජනයාට වතුර සැපයීමට යෝග්‍යයයි භාරගත් ස්ථානයකින් ලැබෙන වතුර මේ උපනීතියෙන් නිදහස්කිරීමට සභාපතිතැනට බලය තිබේ.

6. නාගරික සභාවට අයත් මායිම්තුළ සාදනු ලබන හෝ පිටින් එහි ගෙනෙනු ලබන යම් සිසිල් බීමක් මනුෂ්‍යයින්ට බීමට නුසුදුසු තරම් නරකයයි සභාවේ ලේකම්තැනට හෝ පරීක්ෂකතැනට වැටහීයේවීනම් ඔහුට ඒ බීම අල්වා පළාතේ ප්‍රධාන වෙද්‍යනිලධාරීතැන හෝ පොලිස් මහේස්ත්‍රාත්තැන ඉදිරියට ගෙනයත හැක. එකී පළාතේ ප්‍රධාන වෙද්‍යනිලධාරීතැනට හෝ පොලිස් මහේස්ත්‍රාත්තැනට, ඒ සිසිල් බීම මනුෂ්‍යයන්ගේ අනුභවයට නුසුදුසුයයි පෙනීයේනම් එය නැතිකර දැමීමට නියමකරන්නට ඔහුට පුළුවන. මනුෂ්‍යයන්ට බීමට නුසුදුසුයයි උපාවියට වැටෙන පරිදි ඔප්පුවෙන යම් සිසිල් බීම වර්ගයක් ඇද්ද එය සාදන තැනැත්තා නීතියට විරුද්ධව වරදක්කිරීම ගැන වැරදිකාරයාවේ.

7. සිසිල් බීම කර්මාන්තයට ගන්නා සියලුම බෝතල පෙරපු වතුරෙන් සෝදා ඉතාමත් පිරිසිදුව තබාගන්ට ඕනෑය.

8. සිසිල් බීම පුරවනලද සෑම බෝතලයෙහිම එහි අඩංගු බීම වර්ගයේ නමද, එය සාදන ස්ථානයද, එය සාදන කර්මාන්තශාලාව අයිතිකාරයාගේ හෝ සමාගමේ නමද. ඒට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් දෙනලද නොම්මරයද සඳහන් "ලේබල්" නම් පත්‍රයක් අලවා තිබිය යුතුයි.

9. අවුරුදු දොළහෙන් බාලවූ කිසිවකුගේ, බෝවෙන රෝගයකින් හෝ කුෂ්ඨ රෝගයකින් පෙළෙන කිසිවකු, සිසිල් බීම සාදන කර්මාන්ත ශාලාවක වැඩක නොයෙදිය යුතුයි.

10. සිසිල් බීම බෝතලවල ගෑස් පුරවන වැඩේ යෙදී සිටින සියලුම්දෙනා සියුම් සිදුරු ඇති කම්බි දැලින් සාදනලද මුහුණු වැස්මක්ද, බෙල්ල ප්‍රවේසමට වැස්මක්ද, හම්වලින් සාදනලද අත්මේස්ද ඇඳ සිටිය යුතුයි.

11. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට ලේකම්තැනට පරීක්ෂකතැනට හෝ සභාපතිතැනගේ ලියවිල්ලකින් ඒට බලයලත් වෙනයම් අයකුට සිසිල් බීම සාදන හෝ විකුණන ස්ථානයක් ඇර තිබෙන කොයියම් වේලාවකදී නමුත් එහි ඇතුල්වී එහි සාදනලද හෝ විකිණීමට තිබෙන සිසිල් බීමවලින් කොයියම් වර්ගයකින් නමුත් "සැම්පල්" බෝතලයක් ගැනීමට බලය තිබේ. එසේ සැම්පල් බෝතලයක් ගැනීමට ඉඩනොදෙන එබඳු ස්ථානයේ අයිතිකාරයා හෝ භාරකාරයා නීතියට විරුද්ධව වරදක්කිරීම ගැන වැරදිකාරයාවේ.

එසේ ගන්නාලද "සැම්පලය" පරීක්ෂාකිරීමට නියමිත පරීක්ෂක කෙනකු වෙත වහාම යැවිය යුතුයි. ඔහු විසින් ඒවා පරීක්ෂාකර බලා මනුෂ්‍යාහාර වශයෙන් නුසුදුසුයයි හැඟේනම් ඒ බව සහතිකකර ඔහු විසින් දෙන සහතිකපත්‍රය එම සිසිල් බීම එසේ නුසුදුසු බවට, අනිත් පක්ෂයෙන් එසේ නොවන බව ඔප්පුකරනතුරු, සාක්ෂියක්වේ. මෙසේ මනුෂ්‍යාහාරයට නුසුදුසු බවට ඔප්පුකරණ යම් සැම්පලයක් සිසිල් බීම සාදන හෝ විකුණන ස්ථානයකින් ගන්නාලද්දේද එහි අයිතිකාරයා හෝ කළමනාකාරයා නීතියට විරුද්ධව වරදක්කිරීම ගැන වරදකාරයාවේ.

12. සිසිල් බීම සෑදීමට වතුරගන්නා ළිං එම වැඩේට පමණක් වෙන්කර තැබිය යුතුයි, ඉන් නොනෑයුතුය.

## J.—ළිං.

1. ලෝකල්බෝඩ් සභාවේ නගර සීමාවතුළ ළිඳක් කැණීමට හෝ කැණවීමට මාසයකට ප්‍රථම එම සභාවේ සභාපතිතැනට දන්වා හෝ එම සභාපතිතැනගෙන් ඒට අවසර පත්‍රයක් ලබාගෙන මිස කිසිවකු විසින් ළිඳක් කැණීම හෝ කැණවීම නොකළ යුතුයි.

2. අසූචි වළකට, කුණු වතුර වළකට, වැසිකිළියකට ඌරු කොටුවකට, ගාලකට, හරක් මඩුවකට, පෝරගොඩකට හිල්වූ අගලකට, අත්හැර තිබෙන වැසිකිළියකට, දිරායන කොළ ගෙඩි ආදී ද්‍රව්‍ය හෝ සත්ව ද්‍රව්‍ය ගොඩකට හෝ පෝරකරනලද ඉඩමකට අඩි 50කින් කිට්ටුවෙන් කිසි ළිඳක් කැණවිය යුතුනොවේ.

3. බීමට හෝ ගෙදර වැඩට වතුරගන්නා යම් ළිඳකින් අඩි 50කට වඩා ළඟින් අසූචි වළක්, කුණුවතුර, වළක්, වැසිකිළියක්, ඌරු කොටුවක්, ගාලක් හෝ හරක් මඩුවක් සෑදීම, පෝර හෝ කුණුවියන, කොළ ගෙඩි ආදී ද්‍රව්‍ය සහ සත්ව ද්‍රව්‍ය දැමීම යම් කිසි ඉඩමක් පෝරකිරීම හෝ හිල්වූ අගලකින් දියබසින්නට හැරීම යුතුනොවේ.

4. සියලුම ළිං කලල් මැටිවෙහි තැනූ ගඩොල් සිමෙන්තියෙන් ජලමට්ටම දක්වා බැඳ හෝ යකඩ නලවලින්, සිමෙන්තියෙන් හෝ මැටියෙන් ඇතුළ වටේ පිරියම්කොට නැතහොත් වෙන සුදුසු ආකාරයකින් ළිඳපතුලෙන් හැර අන්‍ය ස්ථානයකින් වතුර ඉනීම නුපුළුවන්වන අන්දමට තැනිය යුතුයි.

5. නැගී වතුර ගැනීම පිණිස ළිංකටේ එක පැත්තක පඩියක් දැමිය යුතුයි. මෙම පඩිය යටින් වතුර බේරී ළිඳට නොවැටී මෙහි 6වෙනි වගන්තියේ සඳහන්වන බැම්මට ඒ වතුර වැක්කෙරෙන හැටියට මෙම පඩිය හිඩැස් නැතුව සෑදිය යුතුයි. වතුර පිටට බැස යන අන්දමට ළිංකටේ මැදසිට බෑවුම ඇතුව ඒ පඩිය තිබිය යුතුයි. එහි ඇතුල් පැත්තේ ළිඳට වතුර කාන්දු නොවෙනසේ ළිං බිත්තියේ දෙකෙළවරට වැටෙන්නට අඟල් 6ක් උස ඇති ලීස්තරයක් තිබිය යුතුයි. ළිඳේ ඉතුරු හරිය යටත් පිරිසෙයින් අඩි 2කුත් අඟල් 6ක් උස ඇති තාප්පයකින් වටකළ යුතුයි.

6. ළිඳ වටේට පොළව මතුපිට අඩි 5ක් පළලට පිටතට වතුර බැස යන අන්දමට හැඩ ඇතිව සිමෙන්ති සහිත ගලි හෝ ගඩොලින් බැම්මක් බැන්ද යුතුයි.

7. ළිඳ පිට වටේ බදින බැම්මේ පිට කෙළවර වටේට සිමෙන්තියෙන් කාණුවක් බැන්ද යුතුයි. ළිඳට කිට්ටුව වතුර හැවතීම වළක්වන පිණිස ඉහතකී කාණුවෙන් වතුර බැහැ ඈතට ගලායාමට දිගින් අඩි 10කට අඩුනොවන තවත් දිග කාණුවක්ද ඇතිවිය යුතුයි.

8. නෑම වතුර ඇදීම පිණිස හෝ වෙන කිසි කරුණක් ගැන ළිංකට හරහට ලෑලි නොදැමිය යුතුයි.

9. පිරිසිදු භාජන දමා ළිඳෙන් වතුර ගතයුතුයි.

10. බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුරගන්නා ළිඳක කටේ සිට අඩි 20ක් ඇතුළත කිසිවකු විසින් රෙදි නොසේදිය යුතුයි.

11. ප්‍රසිද්ධ නාන පළක් වශයෙන් පාවිච්චිකරන ළිඳක් අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් නෑමට වතුර පුරවන්ට බාල්දි සපයා තැබිය යුතුයි. තවද නාමින් සිටින කිසිවකුට වතුර අදින්ට ඉඩනොහැරිය යුතුයි. නාමින් සිටින කිසිවකු විසින් වතුර ඇදීම යුතුනොවේ.

12. යම් ගසක් හෝ ගසක අත්තක් ළිඳ කටට ඉහළින් තිබෙන විට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන හෝ සභාවේ අන්‍ය සනීපාරක්‍ෂක මූලාදෑනියකු එහි ගොස් විභාගකර බලා ගසේ කොළ හෝ ගෙඩිවැටීම කරණකොටගෙන එම වතුරට අනතුරයකැයි හෝ වෙන අන්දමේ වතුර නරක්වීමට හේතුවකැයි එම අයට වැටහිගියේ නම් එම ගස තිබෙන ඉඩම් අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් බරකාරයාට එම ගස හෝ අත්ත කැප්පවීමට හෝ අස්කිරීමට නියමකොට දැන්වීමක් යවන්ට නීතියේ ප්‍රකාර ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට පුළුවන 14 දවසක් තුළදී එම අය ඒ නියෝගයේ ප්‍රකාර කටයුතු නොකෙළේ නම් ඔහු නීතියට විරුද්ධවූ ක්‍රියාවක්කිරීම ගැන වැරදිකාරයෙක්වේ.

13 බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුර ගන්නා යම් ළිඳක වතුර ඉස්සවා ශුද්ධකර වෙනත් උවමනා පිළියම් වැඩකළ යුතුබව නාගරික සභාවේ සභාපතිතැනට වැටහේ නම් ඔහු එසේකිරීමට නියම්කර ලියනලද අණක් එම ළිඳ තිබෙන වත්තේ අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් පදිංචිකාරයාට යැවිය යුතුයි. 14 දවසක් තුළදී ඉහතකී එම නියෝගය පරිදි කටයුතු නොකෙළේනම් නීතියට විරුද්ධ ක්‍රියාවක් ගැන වැරදිකාරයා වේ.

14 යම්විටක ලෝකල්බෝඩ් සභාවේ යෝජනාවකින් සනීපාරක්‍ෂාව පිණිස යම් ළිඳක් වැසීම හෝ බෝවෙන ලෙඩ වැළැක්වීම පිණිස ශුද්ධකිරීම යෝග්‍යයයි තීන්දුවුණොත් එවැනි ළිඳක් පිහිටි ඉඩම අයිතිකාරයාට නොහොත් බදුකාරයාට හෝ බාරකාරයාට එසේකිරීමට නියමකොට ලියනලද අණක් යැවිය යුතුයි එම අණේ ප්‍රකාර 8 දවසකින් එම වැඩ කිරීමට අයිතිකාරයා නොහොත් බදුකාරයා හෝ පදිංචිකාරයා බැඳිසිටී එකී අයිතිකාරයා බදුකාරයා හෝ පදිංචිකාරයා එකී කාලයතුළ ඒ නියෝගයේ පරිදි කටයුතු නොකෙළේවීනම් ඔහු නීතියට විරුද්ධ ක්‍රියාවක් කිරීම ගැන වැරදිකාරයාවේ.

15. ලෝකල්බෝඩ් සභාවේ ලේකම්තැනට, පරීක්‍ෂකතැනට හෝ එම සභාවේ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනුලැබූ අන්කිසිවකුට ළිං පරීක්‍ෂාකරන්නට හෝ ළිං කැණවීමට අදහස්කරගෙන තිබෙන ඉඩම් හෝ ස්ථාන හෝ දැනට තිබෙන ළිං හා ඒ අවට ස්ථාන පරීක්‍ෂාකිරීම පිණිස එහි ඇතුල්වන්නට නීතියේ ප්‍රකාර බලය තිබේ.

## K.—කිරිපළවල්.

1. මෙම් උපනීති උදෙසා කිරිපළ යන්නෙන් කිරි සපයනු ලබන්නාවූද විකිණීම පිණිස කිරි රැස්කොට හෝ තබා තිබෙන්නාවූද යම්කිසි ගවයින් ඇතිකරන ස්ථානයක්, ගවයින් ඇතිකරන ස්ථානයක ඇති ගොඩක්, ගවපට්ටියක් කිරි ගබඩාවක්, කිරි කඩයක් හෝ කිරි සපයන අන් කිසියම් ස්ථානයක් ගනුවසි, තවද මේ සියල්ල ඒව ඇතුළත් "කිරිකාරයා" යන්නට යම් එළදෙනක් ඇතිකරන්නෙක් කිරි සපයන්නෙක් හෝ කිරිපළක පදිංචිකාරයෙක්ද. කිරිපළක් එක්කෙනකුට වඩා වැඩි දෙනකුට අයිතිනම් එවැනි කිරිපළේ කළමනාකාරයා හෝ එහි කළමනාකාරකමෙහි යෙදීසිටින වෙන අයෙක්ද ඇතුළත්වෙත්.

2. ඇර තිබෙන අශුචිවළකට හෝ වළක්නැති වැසිකිළියකට අඩි සියයක් ඇතුළත යම්කිසි වත්තක හෝ ඒව දුගඳ්ධය ලඟාවියහැකි ස්ථානයක හෝ කිසිම කිරිපළක් තබානොගත යුතුයි. තවද කිරිපළකින් අඩි සියයක් ඇතුළත නොවසා තිබෙන අශුචිවළක් හෝ වළක්නැති වැසිකිළියක් නොසෑදිය යුතුයි.

3 කිරිපළේ වත්තේ සභාපතිතැන සතුටුවන අන්දමේ හැටෙන පමණ හොඳින් සාදනලද කාණු තිබිය යුතුයි. තවද කාණුවලට වතුරගසා සේදිය යුතුයි. කිසිම කිරිපළක් අවට භූමියේ අපිරිසිදු වතුර එකතුවී තිබෙන්නට ඉඩනෑරිය යුතුයි.

4. කිරිපළ ඇතුළේ සහ ඒ අවට තිබෙන කුණුකසල සියල්ලම අප්‍රමාදව ඉවත්කළ යුතුයි. හැම දිනපතාම ඉවත් කළ යුතුයි

5. හැම කිරිපළේම පාවිච්චියට පිරිසිදුවූ ආරක්‍ෂාකරනලද වතුර පහසු පමණ දුරින් තිබිය යුතුයි. මේ ජලස්ථානයෙහි හෝ ඒ සමීපයෙහි නෑම හෝ රෙදි සේදීම නොකළ යුතුයි.

6. කිරි එළදෙනුන් සහ මීදෙනුන් ලෙඩවලින් තොරවී සිටිය යුතුයි. තවද බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ කිරිපළභාර යමකු දැනුවත්ව එවැනි රෝගයකින් ළඟදී පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයකුට හාත්පසකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කිසිවෙකු එබඳු කිරිපළ භාර අය විසින් එම කිරිපළේ කටයුතුවල යොදන්නට ඉඩ නොදිය යුතුයි.

7. කිරි දෙවීමට පෙර දෙනුන්ගේ කිරිබුරුළු සහ තනපුඩුත් සෝදන්නට සියලුම කිරිකාරයන් විසින් බලාගත යුතුයි. තවද කිරිදෙවන්නා කිරිදෙවීමට පෙර තම අත් සබන්දමා හොඳකාර සෝදගත යුතුයි. ගොමෙන් හෝ මුත්‍රවලින් කිරි අපිරිසිදු නොවනලෙස හැම ආකාරයෙන්ම ප්‍රවේසම් ගතයුතුයි.

8. කිරිකාරයකු හෝ කිරිපළක් අයිතිකාරයකු විසින් කිරිවලට වතුර හෝ වෙනයම් ප්‍රවස්තර දියජාතියක් හෝ ද්‍රව්‍යයක් එකතුකොට කිරි දූෂ්‍යනොකළ යුතුයි. තවද එසේකරනලද කිරි නොවිකිණිය යුතුයි, විකිණීමට නොහැකිය යුතුයි.

9. කිරිපළකට අයිතිවූ හෝ එහි පාවිච්චියට ගන්නා භාජන, බඩු බාහිරාදිය සහ අනිකුදු උපකරණ පිරිසිදුව තබාගත යුතුයි.

10. කිරිදමා අරින සියලුම භාජන ඉතා පවිත්‍රලෙසද හිසියාකාර වසා පිරිසිදු ද්‍රව්‍යවලින් මූඩි හෝ ඇබගසාද තිබිය යුතුයි. තවද ඒ භාජන කිසිල්ලේ තබාගෙන නොයා යුතුයි තවද බෝතල කටවල ඇඟිලි නොගැසිය යුතුයි.

11. ගවයින් තබන මඩු සහ පට්ටි, ලෝකල්බෝඩ් සභාවේ ගාල් සම්බන්ධ 3වන උපනීතියෙන් වුවමනාකරන කාරණවලට අනුව සහ ඒව යටත්ව පවතී.

12. කිරිපළකට අවසර පත්‍රයක් ලබාගත් සෑම අයටම කිරි තැබීමට සහ සූදානම් කිරීමටද ඔහුගේ රක්‍ෂාවෙහි යොදන සියලුම භාජන ශුද්ධකළ පසු තැබීමටද ගවමඩුවෙන් ඈත ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් වැනවයි පිළිගන්නා දුර ප්‍රමාණයක සහ ස්ථානයක සාදනලද කිරි කාමරයක් තිබිය යුතුයි. ගේබිම සහ බිත්තිත් හාවෙන ස්ථානයෙහි කොන් වටකොට ගේබිමට සිමෙන්ති දැමිය යුතුයි. බිත්ති ගලින් බැඳ සුනුපිරියම්කොට හෝ යතුගා හොඳින් මට්ටම්කළ ලෑලිවලින් හෝ යකඩවලින් සාද සභාපතිතැන විසින් හෝ, සනීපාරක්‍ෂක කොමිසාරිස්තැන විසින් හෝ, ඔහුගේ සහකාරතැන විසින් හෝ, පළාතේ ප්‍රධාන වෛද්‍ය මූලාදෑනිතැන විසින් නියමකරන පරිදි කලින්කල සුදුහුනු හෝ තීන්තගෑ යුතුයි. කිරි කාමරයේ එකිනෙක ඉදිරිව තිබෙන බිත්ති දෙකක්වත් එළිමහනට යාව තිබිය යුතුයි. දූලි ඇතුල්වීම වළක්වන පිණිස වද්දවනලද ලෑලිවලින් වහලට වියන ගැසිය යුතුයි. කාමරයට අඩු ගණනේ එක දොරක් සහ එක කවුළුවක්වත් තිබිය

යුතුයි. විදුරු හෝ වගන පියන්රහිත අඩි 3ක් දිග සහ අඩි 2ක් පළල ජනේලයක් තබා මැස්සන්ට යා නොහැකි දැල් සවිකළ යුතුයි. දොර ජනේලයට කෙලින් හොඳට වැසෙනසේ මැස්සන්ට ඇතුල්විය නොහැකි දැල්ගසා සාදා හොඳින් වසාතිබියයුතුයි. කිරිගරුඬලෑලි, ගල්ලෑලි, සින්ක් තහඩු හෝ වෙනයම් දියකාන්දු නොවන්නේයයි පිළිගත් ද්‍රව්‍යයකින් තව්වුව දමනලද මේසයක් කිරිකාමරයේ තිබිය යුතුයි. මේ කාමරය කිරිතැබීමට සහ සූදානම් කිරීමට හැර වෙන කිසිම වැඩකට පාවිච්චි නොකළ යුතුයි.

13. කිරිපලකට අවසරලත් සෑම අයම ඔහුගෙන් කිරිගන්නා අයගේනම් ලේඛනයක් තබාගත යුතුයි. එය ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැන, සනීපාරක්ෂක කොමිසාරිස්තැන, ඔහුගේ සහකාරතැන, පළාතේ ප්‍රධාන වෛද්‍ය මූලාදෘනිතැන ලෝකල්බෝඩ් සභාවේ ලේකම්තැන හෝ, එහි පරීක්ෂකතැන විසින් පරීක්ෂාකරන පිණිස අවකාශ ඇතිසේ තැබිය යුතුයි.

14. එක් එක් කිරිපලේ තබාගන්නට අවසරලැබී තිබෙන දෙනුන් ගණන අවසර පත්‍රයේ සඳහන්විය යුතුයි.

15. කලින් සභාපතිතැනගෙන් අවසරලබා නොගෙන කිරිපළක් තුබූ ස්ථානයෙන් අන්තැනකට ගැනීම හෝ අවසර පත්‍රයේ සඳහන්වන ස්ථානයේ හැර වෙන ස්ථානයක කිරිදෙවීම කිරිපළකට අවසරලත් කිසිවකු විසින් නොකළ යුතුයි.

16. පරීක්ෂක මූලාදෘනීන් කිරිපළ බලන්නට ආවිටක ඔවුන්ගේ රපෝර්තු ලිවීම පිණිස කිරිපළකට අවසරලත් සෑම අයම ඔහුගේ කිරිකාමරයේ රපෝර්තු පොතක් තැබිය යුතුයි.

17. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට සනීපාරක්ෂක කොමිසාරිස්තැනට ඔහුගේ සහකාරතැනට පළාතේ ප්‍රධාන වෛද්‍යමූලාදෘනිතැනට ලෝකල්බෝඩ් සභාවේ ලේකම්තැනට හෝ පරීක්ෂකතැනට යම් අවසරලත් කිරිපළකින් හෝ කිරි වෙළඳාම්කරන්නාවූ හෝ විකිණීමට තබාසිටින්නාවූ කෙනකුගෙන් පරීක්ෂාකිරීම පිණිස කිරි විකක් ගැනීමට සෑමකල්හිම බලය තිබේ.

18. ලෝකල්බෝඩ් නගර සීමාතුළ පිහිටි සෑම කිරිපළම සභාපතිතැන විසින් ලියාපදිංචිකොට එක් එක් ඉල්ලුම්කාරයාට ලියා පදිංචිකළ බවට ඔහුගේ නම සහ ගොම්මරයත් දරන පත්‍රයක් දෙනුලැබේ. මේ පත්‍ර ලෝකල්බෝඩ් සභාවේ බලය ලත් යම් මූලාදෘනියකු විසින් හෝ සනීපාරක්ෂක පරීක්ෂකයකු විසින් බලන්නට ඉල්ලූවිටක පෙන්විය යුතුයි.

19. මෙම උපනීතිවලින් පිටපතක් සෑම කිරිපළේම කිරිකාමරයේ එල්ලා තැබිය යුතුයි.

ඉහත සඳහන්වූ නියෝග යටතේ අවුරුදු පතා දෙන බලපත්‍රවලට අයකළ හැකි ගණන් ලේඛනය.

| බලපත්‍රය. | අවුරුද්දකට අය. රු. | ශ |
|---|---|---|
| පාන්ගෙවල් ගැන .. .. .. .. .. | 6 | 00 |
| භෝජනශාලා ගැන .. .. .. .. .. | 6 | 00 |
| තේ සහ කෝපි කඩ ගැන .. .. .. .. | 3 | 00 |
| කාමර 5ක් හෝ ඉන් අඩුව ඇති ගාල් ගැන .. .. .. | 10 | 00 |
| සෑම වැඩිපුර කාමර 5කට රු. 10 පවත් රු. 100 දක්වා .. .. .. | | |
| එලදෙනුන් 3 දෙනෙක් හෝ ඊට අඩුවෙන් සිටින කිරිපළවල් ගැන .. .. | 3 | 00 |
| එලදෙනුන් 3 දෙනෙකුට වඩා සිටින කිරිපළවල් ගැන .. .. .. | 6 | 00 |
| රෙදි අපුල්ලන ස්ථාන ගැන .. .. .. .. | 3 | 00 |
| පොදු නවාතැන් පළවල් ගැන .. .. .. .. | 6 | 00 |
| පෝර කම්හල පළවල් ගැන .. .. .. .. | 100 | 00 |
| ලේ හෝ මස්කැබලි ලේතැම්බීම හෝ වේලීම ගැන .. .. .. | 100 | 00 |
| සම් පදම්කරන ස්ථාන ගැන .. .. .. .. | 100 | 00 |
| සතුන්ගේ තෙල් උණුකිරීම හෝ පෙරීම.. .. .. .. | 50 | 00 |
| සබන් සෑදීම ගැන .. .. .. .. .. | 50 | 00 |
| පොල්ලෙලි පල්කිරීම පිණිස තිබෙන කොටු ගැන .. .. .. | 3 | 00 |
| කොහු සායම් පෙවීම ගැන .. .. .. .. | 2 | 50 |
| යන්ත්‍රමගින් වැඩකරන පොල්තෙල් කම්හලශාලා ගැන .. .. .. | 100 | 00 |
| කොහු කම්හලය සහ රුස්කිරීම ගැන .. .. .. .. | 25 | 00 |
| හොන්ඩර 5ට වඩා උම්බලකඩ ගබඩාකිරීම ගැන .. .. .. | 5 | 00 |
| හම්, ඇට, සාදන පෝර හෝ පෝර සෑදීම පිණිස ගන්නා ද්‍රව්‍ය එක හෝන්ඩයකට වඩා ගබඩා කිරීම ගැන .. .. .. .. .. | 10 | 00 |
| කළුගල් හෝ කබුක් වළවල් ගැන .. .. .. .. | 50 | 00 |
| බොරළු වළවල් ගැන .. .. .. .. | 25 | 00 |
| උළුගෙඩොල් කැපීම ගැන .. .. .. .. | 15 | 00 |
| හුනු පෝරණු ගැන .. .. .. .. .. | 12 | 00 |
| සිසිල්බීම කම්හලශාලා ගැන .. .. .. .. | 100 | 00 |
| ප්‍රසිද්ධ නාන ස්ථාන ගැන .. .. .. .. | 6 | 00 |
| මිනිරන් මඩු හෝ ශුද්ධකරන තැන් ගැන .. .. .. | 50 | 00 |

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 4,289, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1925ක්වූ ජූලි මස 14වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ හිනිදුම්පත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

අන්තිම සිතියමේ නො. 472. ගම—බටුවන්ගල. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2D | යාගලදෙනිය .. .. | බටුවන්ගල දෙලපිල්ලෙගේ මතෙස් .. | කුඹුර .. | 1 | 3 | 14 |
| 2E | ගල්පොත්තෙදෙනිය .. | එම .. .. | එම .. | 0 | 3 | 30 |
| 2F | ගල්පොත්තෙදෙනියහේන .. | — .. .. | මුඩුබිම .. | 0 | 0 | 2* |

අන්තිම සිතියමේ නො. 492. ගම—විරපාන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 4AZ | කලුගලවිලතැන්න .. .. | — .. .. | හේන .. | 0 | 0 | 20* |
| 4BA | මූරුතවෙලගොඩැල්ල නොහොත් දෙල් ගහගොඩැල්ල | — .. .. | එම .. | 0 | 1 | 7* |
| 4BB | එම .. .. | විරපාන රනසිංහ අප්පුහාමි .. | එම .. | 1 | 3 | 0 |
| 4BC | එම .. .. | එම .. .. | කොරටුව .. | 0 | 2 | 5 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4BD | මුරුතවෙලගොඩැල්ල නොහොත් කජ්ජුගහගොඩැල්ල | වීරපාන වී. පී. පිංචෝරිස් | හේන | 3 2 15 |
| 4BE | එම | — | එම | 3 1 9 |
| 4BF | එම | වීරපාන පී. පී. පිංචෝරිස් | එම | 4 0 23 |
| 4BG | සිද්දකැට්ටයෙවිලගොඩැල්ල | වීරපාන ඇජ්. සමරවික්‍රම | එම | 5 1 21 |
| 4BH | වැවරවිලන්ටඹුල්ලදෙනිය | වේරපාන කෝරලගේවගේ අප්පු | කුඹුර | 1 2 10 |
| | අන්තිම සිතියම 484. ගම—හිනිදුම. | | | |
| 485F | වතුරවෙකැලේ | ජී. සංකෝනිස් | කැලෑව | 0 2 21 |
| 321U | කම්පට්ටගහගොඩැල්ල නොහොත් කලුගෙන්දුව | හිනිදුම ඩී. ඇම්. විජේවර්ධන | හේන | 3 2 2 |
| 321V | කලුගෙන්දෙවෙගල්දෙනිය නොහොත් කම්පතගහදෙනිය | එම | දෙනිය | 0 3 5 |
| 321W | කලුගෙන්දෙවෙඹුගලදෙනිය නොහොත් කම්පත්තගහදෙනිය නොහොත් කම්පත්තගහඹකන්ද | — | දෙනිය සහ හේන | 1 0 26* |
| 321X | කළුගලගහගොඩැල්ල | — | හේන | 0 1 0* |
| 321Y | එම | හිනිදුම පදිංචි කුමාරගෙ අන්දිරිස් | එම | 1 0 7 |
| | අන්තිම සිතියම 490. ගම—කෝරලගම. අයිතිකමකියන්නා—පී දොන් ලියෝරිස් ඇප්පල පොලිස්මුලාදෑනියා. | | | |
| 36AI | ගල්පොත්තෙපැලැස්සගොඩ නොහොත් දොඹන්ගහකොඩ | — | රබර් වැවිල්ල | 0 1 8 |
| | අන්තිම සිතියම 482. ගම—හිගුන්මඩුව. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | |
| 50L | කහඹිලියාවලකඩිකුච්චිබේහේන | ගොඩගේ උරුනේරිස් කැටගෙනෙ පදිංචි | හේන | 1 3 17 |
| 50M | කැටම්කුඹුරේදෙනිය | ජේ. ඩබ්ලිව්. ඩීරෙනිස් ඉහලහිගුන්මඩුව | කුඹුර | 4 0 3 |

* තහනම් ඉඩම්. (විකිණීමට නොවේ.)

මෙම ඉඩම්වල තක්සේරු මිල විකුණන වේලාවේදී දැනුම්දෙනවා ඇත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ මහසෙක්‍රතාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඕ. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරීස් වෙනුව.

---

**No. 4,290, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 14වෙනි දිනවූ අඟහරුවාද පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ කඩවත්සතරකුල කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියම 12,542. ගම—ඉහලගොඩ. අයිතිකමකියන්නා—රාජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බූස්සේහේනකන්ද | ගාල්ලේ මහා වීදියේ නොම්බර 30 ගෙයි පදිංචි ඩබ්ලිව්. ඇල්. ඇම්. මහමඩ් | කැකිල්ල ඉඩම | 2 0 15 |

දැන්වීමයි.—මෙම ඉඩමේ තක්සේරුව විකිනීමේදී දන්වනවා ඇත.

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන් සහ ඒකේ සිතියම සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ මහසෙක්‍රතාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඕ. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහසෙක්‍රතාරීස් වෙනුව.

---

**No. 4,291, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 9වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ තල්පෙපත්තුවේ කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

මුල් සිතියම 11,947. ගම—උඩුබැවිටව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

